# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/24 - 2018 ජනවාරි මස 15 වැනි සඳුදා - 2018.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීමයි

*මගේ යොමු අංකය* : එන්සීපී/එච්ජී/එල්02/343 (VII).

*ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : එල්ඩී/05/2001/ඩී/448.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1782/38 දරණ 2012.11.02 දිනැති *ගැසට්* පත්‍රයේ සඳහන් පරිදි හිඟුරක්ගොඩ ගුවන් හමුදා කඳවුර පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම සම්බන්ධයෙන් 7 වගන්තියේ (1) උප වගන්තිය යටතේ කටයුතු කරන බව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂ මොහොට්ටිගේ දෝණ ප්‍රියදර්ශණී පුෂ්ප කුමාරි වන මම මෙයින් දැනුම් දෙමි.

*අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවෙහි පොළොන්නරුව මැනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද POHG/2002/865 හා 2003.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි සඳහන් කැබලි අංක 5, 7, 8, 9, 10 පහත පරිදි නැවත සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 05 - ඉඩමේ නම: හිඟුරක්දමන - විස්තරය: වරාහේන හිඟුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි ගනේගේ රාළලාගේ ඩිංගිරි අම්මා යන අය හිමිකම් කියන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.286 ක් වූ ඉඩම**

*උතුර*: බී. එම්. කලුබණ්ඩා හිමිකම් කියන ඉඩම හා පාර; *නැගෙනහිර*: පාර; *දකුණ*: පාර හා කැබලි අංක 06; *බස්නාහිර*: ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම් මායිම් වේ. (අංක පො/ප්‍ර/හිගු/5612 දරණ දීමනා පත්‍රය මගින් රූඩ් 02 ප්‍රමාණයකට හිමිකම් කියයි. ඉතිරි ප්‍රමාණය ඩිංගිරි අම්මා යන අය විසින් අනවසරයෙන් වගා කරන ලද රජයේ ඉඩම් කොටසකි.)

**කැබලි අංක 07 - ඉඩමේ නම: හිඟුරක්දමන - විස්තරය: අංක 16 කුමාරගම, හිඟුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි දරාව කුඹුරේ ගෙදර දයාරත්න යන අය විසින් හිමිකම් කියන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.909ක් වූ ඉඩම**

*උතුර*: හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *නැගෙනහිර*: කැබලි අංක 01 හා ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම; *දකුණ*: ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම හා කැබලි අංක 08; *බස්නාහිර*: කැබලි අංක 08 හා හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව මායිම් වේ. (මෙම ඉඩම් කොටස සඳහා දරාවේ කුඹුරේ ගෙදර ප්‍රසන්න ලලිත් බණ්ඩාර හෙක්ටයාර් 0.4545ක් සඳහා මින් සං II පියවර 16, ඉ.සං.ආ බලපත්‍රයක් මගින් ද, දරාවේ කුඹුරේ ගෙදර මහින්ද සෙනරත් බණ්ඩාර හෙක්ටයාර් 0.4545ක් සඳහා මින් සං. II පියවර 16 බී ඉසං. අ. බලපත්‍රයක් මගින් හිමිකම් කියයි.)

**කැබලි අංක 08 - ඉඩමේ නම: හිඟුරක්දමන - විස්තරය: අංක 15 කුමාරගම, හිඟුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි වක්කුඹුරේගෙදර පුංචි බණ්ඩා යන අය හිමිකම් කියන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.789ක් වූ ඉඩම**

1A - G 26947 - 14 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උතුර*: හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *නැගෙනහිර*: කැබලි අංක 07 හා ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම; *දකුණ*: ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම හා කැබලි අංක 09; *බස්නාහිර*: කැබලි අංක 09 හා හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව මායිම් වේ. (මින්නේරිය සංවර්ධන II පියවර අංක 15 ඉ.සං. ආ. බලපත්‍රය යටතේ හිමිකම් කියයි.)

**කැබලි අංක 09 - ඉඩමේ නම: හිගුරක්දමන - විස්තරය: අංක 14 කුමාරගම, හිගුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි හේවා ගමගේ ජෝන් හා හේවා ගමගේ පියදාස හිමිකම් කියන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.957ක් වූ ඉඩම**

*උතුර*: හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *නැගෙනහිර*: කැබලි අංක 08 හා ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම; *දකුණ*: ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම; *බස්නාහිර*: කැබලි අංක 10 හා හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව මායිම් වේ.මෙම ඉඩම් කොටසට පහත අය ඉදිරිපත්ව සිටී. (මෙම ඉඩම සඳහා හේවාගමයේ ජෝන් යන අය හෙක්ටයාර් 0.478ක් ප්‍රමාණයක් සඳහා මින්නේරිය සංවර්ධන ව්‍යාපාරයේ II පියවර අංක 14ඒ ඉ.සං.ආ. බලපත්‍රයක්ද හේවාගමගේ පියදාස යන අය හෙක්ටයාර් 0.479ක් යටතේ මින්නේරිය සංවර්ධන ව්‍යාපාරයේ II පියවර අංක 14 බී ඉ.සං.ආ. බලපත්‍රයක් මගින් හිමිකම් කියයි.)

**කැබලි අංක 10 - ඉඩමේ නම: හිගුරක්දමන - විස්තරය: අංක 313 සාමපුර, හිගුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි මඩුවේ ආරච්චිලාගේ උඩගෙදර පුංචි මහත්තයෝ යන අය හිමිකම් කියන ප්‍රමාණයෙන් අක්කර 04 ක් වූ ඉඩම**

*උතුර*: හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *නැගෙනහිර*: හාවාපැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *දකුණ*: පන්සල පිහිටි ඉඩම; *බස්නාහිර*: විද්‍යාලෝක විද්‍යාලය පිහිටි ඉඩම මායිම් වේ. (මෙම ඉඩම සඳහා මඩුවෙ ආරච්චිලාගේ උඩගෙදර පුංචි මහත්තයෝ යන අය නමින් මින්නේරිය සංවර්ධන ව්‍යාපාරයේ 1 පියවර 677 වාර්ෂික බලපත්‍රය (ඉ.සං.අ. බලපත්‍රයක් වෙනුවට) මගින් හිමිකම් කියයි.

II **ඉඩමේ නම: හිගුරක්දමන - විස්තරය: ගුවන්තොටුපොල පාර, කොහොඹවැටිය හිගුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි ගීකියන ගමරාළලාගේ පියසේන යන අය හිමිකම් කියන ප්‍රමාණයෙන් අක්කර 3 1/2ක් වූ ඉඩම**

*උතුර*: හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *නැගෙනහිර*: අගම්පොඩි සුගතපාල ද සොයිසාගේ ඉඩම; *දකුණ*: ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම; *බස්නාහිර*: පන්සල පිහිටි ඉඩම මායිම් වේ. (මින්නේරිය සංවර්ධන ව්‍යාපාරයේ 1 පියවර 446 ඉ.සං.අ. බලපත්‍රය මගින් හිමිකම් කියයි.)

III **ඉඩමේ නම: හිගුරක්දමන - විස්තරය: අංක 38 කුමාරගම හිගුරක්ගොඩ යන ලිපිනයේ පදිංචි අංගම්පොඩි සුගතපාල ද සොයිසාගේ යන අය හිමිකම් කියන ප්‍රමාණයෙන් අක්කර 1 1/2ක් වූ ඉඩම**

*උතුර*: හාවා පැන්න ඇළ සඳහා රක්ෂිත බිම් තීරුව; *නැගෙනහිර*: කට්ටි අංක 9 ඉඩම; *දකුණ*: ජී. ජී. පියසේනගේ ඉඩම; *බස්නාහිර*: ගුවන් හමුදා කඳවුර හිමිකම් කියන ඉඩම මායිම් වේ. (NCP/HG/5/38-R ඉ.සං.ආ. බලපත්‍රය මගින් හිමිකම් කියයි.)

ආර්. එම්. ඩී. පී. පුෂ්ප කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
හිගුරක්ගොඩ.

2017 නොවැම්බර් මස 30 වැනි දින,
හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

02 –60

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.